# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2238/17 – 2021 ජූලි 28 වැනි බදාදා – 2021.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිටි කෝරළේ පල්ලේ පත්තුව සුළු කොට්ඨාසයේ, විලේගොඩ (අ.ග.පි. 666) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක R/EHL/2017/733 හා 2018.05.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. කැබලි අක්ෂර **‘A’** – ඇහැලියගොඩවත්ත – **ප්‍රමාණය: හෙක්.** 1.2141

උතුරට: මාර්ග (ප්‍රා.ස.) සහ පුස්සැල්ලාව වැව්ලි සමාගමට අයත් ඇහැලියගොඩවත්ත; නැගෙනහිරට: මාර්ග (ප්‍රා.ස.), පුස්සැල්ලාව වැව්ලි සමාගමට අයත් ඇහැලියගොඩවත්ත සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B; දකුණට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B සහ මාර්ග (ප්‍රා.ස.); බටහිරට: මාර්ග (ප්‍රා.ස.).

02. කැබලි අක්ෂර **‘B’** – ඇහැලියගොඩවත්ත – **ප්‍රමාණය: හෙක්.** 0.5356

උතුරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A සහ පුස්සැල්ලාව වැව්ලි සමාගමට අයත් ඇහැලියගොඩවත්ත; නැගෙනහිරට: පුස්සැල්ලාව වැව්ලි සමාගමට අයත් ඇහැලියගොඩවත්ත සහ මළ දොළ; දකුණට: මාර්ග (ප්‍රා.ස.); බටහිරට: මාර්ග (ප්‍රා.ස.) සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2017/VE/396.
2021 අප්‍රේල් මස 22 වැනි දින.
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 79



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.